(55)

2000.08.22.

නියෝගය.

25/8/00

අ/කලේ:-

අ.දි.වි.

(56)

2000.08.25.

නියෝගය.

පැ.කරු වෙනුවෙන් නීතිඥ ගර්ෂිනී වික්‍රම.

1වි. වෙනුවෙන් නීතිඥවමරි වීරසේකර.

2වි.නැත. පෙනීසිටීමක් නැත.

නියෝගය විවෘත අධි.දි. ප්‍රකාශ කරන ලදී.

විභාගය - 1/11/00x

අ/කලේ:-

අ.දි.වි.

==========

කොළඹ දිසා අධිකරණ:- අංක.02දිය.

කොළඹ අතිරේක දිසා විනිසුරු - එම්.ටී.ආර්.තාරක මැතිතුමා ඉදිරිපිටදීය,

සටහන් ගැනීම:

( ල.ලේ - ජේ.එම්.යේසාරත්න මෙය. විසිනි)

නඩු අංකය:-21819/එම්.ආර්. 2000.08.25.

නි යෝ ග ය.

මෙම නඩුවේ අධිකරණය විසින් නියෝග කළ යුතු වන්නේ, ප්‍රථමයෙන් 1 වනවිත්තිකරුගේ ඉල්ලීම මත නඩුවේ විසඳිය යුතු ප්‍රශ්න ඉදිරිපත් කළ යුතුද, නැතහොත් පැමිණිලිකරුගේ ඉල්ලීම මත විවාරණ යුග ලේඛණ අනාවරණය කිරීම පිළිබඳ කරුණ සලකා බැලිය යුතුද යන්නයි.

මෙම නඩුව විභාගයට නියම කිරීමට ප්‍රථම 1වන විත්තිකරු විසින් 99.02.16 වන දිනැති මෝසම ගොනු කරමින් පැමිණිල්ල මඟින් නඩු නිමිත්තක්

H 4793 - 1,000,000 (99/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

Tr. & Audit 141 *a*
(E 2' c.d.) 12/46



අනාවරණය කර නොමැති හෙයින් සහ පැමිණිලිකරුගේ නඩුව කාලාවරෝධී වී ඇති හේතුව මත පැමිණිල්ල නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලීමක් කරන ලද අතර, අධිකරණය විසින් එම ඉල්ලීම පිළිබඳව නියෝගයක් කිරීමට පෙර පැමිණිලිකරු විසින් විචාරණ සහ ලේඛණ අනාවරණය කිරීම සඳහා ඉල්ලීමක් කර ඇත.

ඉන්පසුව පැමිණිලිකරුගේ විචාරණ සහ ලේඛණ අනාවරණය කිරීම සඳහා කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් විත්තිකරුවන්ට නොතිසි නිකුත් කිරීමෙන් පසුව ඒ පිළිබඳව අධිකරණය විසින් නියෝගයක් කිරීමට පෙර 1 වන විත්තිකරුගේ 99.02.16 වන දිනැති මෝසම මගින් කරනලද ඉල්ලීම් පිළබඳව අධිකරණය විසින් 99.05.17 වන දිනැති නියෝගය කර ඇති අතර එදින නඩු විභාගය 1999.06.09 වන දිනට නියම කරන ලදී. ඉන්පසුව 1999.05.26 වන දින විත්තිකරු විසින් විචාරණය සඳහා පැමිණිලිකරු විසින් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත්කර ඇති අතර, 99.06.03 වන දින 1 වන විත්තිකරු විසින් සිය ලිඛිත විසඳිය යුතු ප්‍රශ්න ඉදිරිපත් කර ඇත. ඉන්පසුව 99.06.15 වන දින අධිකරණය විසින් කරන ලද නියෝගය මගින් පැමිණිලිකරු විසින් විචාරණ සහ ලේඛණ අනාවරණය කිරීම සඳහා කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් වැඩිදුර පියවර ගැනීමට නියම කර ඇති අතර නඩු විභාගය 99.09.13 වන දිනට කල් තබා ඇත. 1999.09.13 වන දින විත්තිකරුගේ නීතිඥවරයා විසින් මෙම නඩුවේ විභාගය ආරම්භ කරන ලෙසටත්, ඉන්පසුව නීතිමය කරුණු මත ඉදිරිපත් කරනු ලබන විසඳිය යුතු ප්‍රශ්න මූලික විසඳිය යුතු ප්‍රශ්න වශයෙන් විභාග කර ඒ පිළබඳව තීරණයක් කිරීමෙන් පසුව පැමිණිලිකරු විසින් විචාරණ සහ ලේඛණ අනාවරණය කිරීම සඳහා කරන ලද ඉල්ලීම පිළිබඳවිමසීම පවත්වන ලෙස ඉල්ලීමෙන් පසුව අධිකරණය ඒ පිළිබඳව දෙපාර්ශ්වයේලිඛිත දේශණ ගොනු කරන ලෙසට නියෝග කර ඇත. ඒ අනුව දෙපාර්ශ්වය විසින් ලිඛිත දේශණ ගොනු කර ඇත.

මෙම නඩුවේ පැමිණිලිකරු විසින් විචාරණ සහ ලේඛණ අනාවරණය කිරීම සඳහා ඉල්ලීමක් කිරීමට ප්‍රථමයෙන් 1 වන විත්තිකරු විසින් ගොනු කරන ලද 1999.02.16 වන දිනැති මෝසම මගින් එම මෝසමෙහි සඳහන් කරුණු මත පැමිණිලිකරුගේ නඩුව නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලීමක් කිරීමෙන් පසුව අධිකරණය විසින්

ඒ සම්බන්ධයෙන් දෙන ලද 99.05.17 වන දිනැති නියෝගය අනුව 1 වන විත්තිකරු විසින් සිය මෝසම මඟින් කරන ලද ඉල්ලීම් **ප්‍රතික්ෂේප** කරමින් කියා සිටියේ එහි සඳහන් කරුණු නඩු විභාගය ආරම්භ කිරීමෙන් පසුව සලකා බලනු ලබන බවයි.

විචාරණ සහ ලේඛණ අනාවරණය කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් නඩුවක විසඳිය යුතු ප්‍රශ්න සලකා බැලීමට ප්‍රථමයෙන් සලකා බැලිය යුතු බවට සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධානයක් නොමැති අතර සිවිල් නඩු විධාන සංග්‍රහයේ 108 වන වගන්තියේ විධිවිධාන අනුව යම් ආකාරයක අනාවරණය කර ගැනීමක් හෝ පරීක්ෂා කිරීමක් බලාපොරොත්තු වන්නේ යම් පාර්ශ්වකරුවෙකුගෙන්ද, ඒ පාර්ශ්වකරු ඊට හෝ එහි යම් කොටසකට විරෝධය පාන්නේ නම්ද, එසේ අනාවරණය කර ගැනීමේ හෝ පරීක්ෂා කිරීමේ අයිතිවාසිකම් නඩුවේ යම් විසඳිය යුතු ප්‍රශ්නයක් මත හෝ විවාදාපන්න ප්‍රශ්නයක් මත රඳා පවතින බවට හෝ එසේ අනාවරණය කර ගැනීමක් හෝ පරීක්ෂා කිරීමේ අයිතිවාසිකමක් පිළිබඳව තීරණයක් කිරීමට පෙර එකී විසඳිය යුතු ප්‍රශ්නය ගැන හෝ විවාදාපන්න ප්‍රශ්න ගැන විනිශ්චයක්කිරීම වෙනත් හේතුවක් නිසා යෝග්‍ය බවට අධිකරණය සෑහීමට පත් වුවහොත් එම විසඳිය යුතු ප්‍රශ්නය හෝ විවාදාපන්න ප්‍රශ්නය ගැන පළමුව විනිශ්චයක් කරන ලෙස අධිකරණය විසින් ආඥාවක් කිරීමද අනාවරණය කිරීම හෝ පරීක්ෂා කිරීම පිළිබඳප්‍රශ්නය ගැන තීරණයක් කිරීම පසුවට තැබීමද අධිකරණය විසින් කළ හැකිය.

එම වගන්තියේ විධිවිධාන අනුව විචාරණ හෝ ලේඛණ අනාවරණය කිරීම සම්බන්ධව ප්‍රශ්නයක් පිළිබඳව තීරණයක් කිරීමට ප්‍රථම අවධාරණය කරුණු අනුව නඩුවේ මූලික විසඳිය යුතු ප්‍රශ්න ඉදිරිපත් කිරීමෙන් පසුව ඒ පිළිබඳව පළමුව තීරණයක් කිරීමට හැකියාව ඇත. මෙම නඩුවේ **විශේෂයෙන්ම** 1 වන විත්තිකරු විසින් ඉදිරිපත්කරන ලද 99.02.16 වන දිනැති මෝසමේ සඳහන් නීතිමය කරුණු පිළිබඳව මූලිකවිසඳිය යුතු ප්‍රශ්න සිය ලිඛිත විසඳියයුතු ප්‍රශ්න මඟින් ඉදිරිපත්කර ඇති හෙයින්, ඒ මත නඩුවේ අවසානයක් ඇති වියහැකි බැවින් විචාරණ සහ ලේඛණ අනාවරණය කිරීම සඳහා පැමිණිලිකරු විසින් කර ඇති ඉල්ලීම සලකා බැලීමටප්‍රථම නඩුවේ දෙපාර්ශ්වය විසින් විසඳිය යුතු ප්‍රශ්න ඉදිරිපත් කිරීමෙන් පසුව මූලික විසඳියයුතු ප්‍රශ්න සම්බන්ධයෙන් නියෝගයක් කිරීම සුදුසු බවට තීරණය කරමි.

අ/කලේ(එම්.ටී.ආර්.තාබෲ)
අතිරේක දිසා විනිසුරු - කොළඹ.
2000.08.25.

මෙම පත්‍රය ඇත්වෙසින් තොදුඅ.නඩු අංක:- ...19/වි.අං. ... නඩුවේ ගොනු කර ඇති (28),(55) සහ (56) දරණ දෛනික සටහන්වල සහ 200...
... දිනැති නියෝගයේ සත්‍ය සහතික පිටපතක් බවට මෙයින් සහතික කරමි.
ස/ලි:කරුවේ:- ... සැසඳුවේ:- ...